**ඇදහිල්ල සුව කරන්නන්, දිව්‍ය සුව කිරීම් සහ කොරොනා වෛයිරස්**

මෙම වෛරසය හා සම්බන්ධ කාරණය තුළ සියලුම ඇදහිල්ල සුව කරන්නන් සැඟවී සිටින බව පවසමින් විහිළු රාශියක් පැතිරෙමින් පවතී. සමහරුන් අභියෝග කරන්නේ මෙම ඇදහිල්ල සුව කරන්නන් සියලු රෝහල් වෙත ගොස් මිනිසුන් සුවපත් නොකරන්නේ මන්ද යන්නයි. මේ සියල්ල සිදුවී ඇත්තේ ශ්‍රී ලංකාවේ පුද්ගලයින් දෙදෙනෙකුගේ පිස්සු ක්‍රියා නිසාය.

මෙම රෝගය අවසාන කාලයේ ලකුණක් බව අපි දනිමු. මෙය මිනිස් සංහතියේ දුෂ්ටකමට විනිශ්චයක් බවත්, පසුතැවිලි වී උන් වහන්සේ වෙතට හැරෙන ලෙස සියලු මිනිස් සංහතිය වෙත කරන කැඳවීමක් බවත් අපි දනිමු. ඉතින් ප්‍රශ්නය නම් යේසුස් වහන්සේ කොරොනා වෛයිරසයෙන් මිනිසුන්ව සුව කරයිද යන්නයි. ඔව්, මිනිසුන් උන් වහන්සේට හඬනගන්නේ නම් නිතැතින්ම උන්වහන්සේ සුව කරන බවයි.

ස්වාමීන් වන යේසුස් වහන්සේම අපව සුව කරන ‘දිව්‍යමය සුව කිරීම’ ගැන මම විශ්වාස කරමි. මම ඇදහිල්ලෙන් සුව කරන්නන් විශ්වාස නොකරමි - ඒනම් හාස්කම් කරන බව කියා සිටින මිනිසුන්ව. ඔවුන් යේසුස් වහන්සේගේ නාමය සඳහන් කළත් ඔවුන් එසේ කරන්නේ යේසුස් වහන්සේ වෙනුවෙන් නොවේ. මා අදහස් කළේ කුමක්ද? වෙනසක් ඇත. මගේ දේවසේවයේදී මට යේසුස් වහන්සේගේ නාමය සඳහන් කළ හැකි නමුත් මා කරන සෑම දෙයක්ම උන් වහන්සේට හෝ උන්වහන්සේගේ නාමයට මහිමයට නොව මා මහිමයට පත් කර මා කෙරෙහි අවධානය යොමු කිරීමයි. ඒමගින් මම විශාල රඟදැක්මක් ඉදිරිපත් කරයි. සාක්ෂි ඉල්ලා සිටි, විශාල රඟදැක්මක් ඉදිරිපත් කරන්නේ ස්වාමින් වහන්සේව මහිමයට පත් කිරීමට නොව, මා බලවත් මිනිසෙකු ලෙස මා වෙත අවධානය යොමු කිරීමටය. මෙහි ප්‍රතිපලය වනුයේ මිනිසුන් මුළුමනින්ම සුවය නොලබන අතර සහ ඕනෑවට වඩා අතිශයෝක්තියට නැංවූ සාක්ෂි හෝ වේදිකාගත කළ / පෙර සූදානම් කළ සාක්ෂි බවට පත්වේ.

අද ගැටලුව වන්නේ බොහෝ අය සුවය ලබා ගැනීම සඳහා මිනිසෙකු දෙස බැලීමයි. ලෝකය මෙම ඇදහිල්ල සුව කරන්නන් දෙස බලා අභියෝග කරමින් ඔබගේ සුව කිරීමේ ශක්තිය අපට පෙන්වන්නැයි විහිළුවට ලක් කරනු ලබයි. මෙහි අවසාන ප්‍රතිපලය වන්නේ ස්වාමින්වහන්සේගේ නාමය ලජ්ජාවට පත් කිරීමයි.

කෙසේ වෙතත්, අද මට සෑම කෙනෙකුටම විශ්වාසයෙන් යුතුව මතක් කිරීමට අවශ්‍යයි, යේසුස් වහන්සේ අද පවා සුව කරන බවත්, උන්වහන්සේට කල නොහැකි කිසිවක් නොමැති බවත්ය. අප කළ යුතුව ඇත්තේ උන් වහන්සේට හඬගැසීම පමණි. යාකොබ් 5: 14-15 පවසනවා ‘නුඹලා අතරෙහි යමෙක් රෝගාතුරව සිටින්නේද? ඔහු සභාවේ වැඩිමල්ලන්ට හඬගසාවා; ඔවුහු ස්වාමින් වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤා කරත්වා. එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රොගාතුරයාට සුවය ලැබේ. ස්වාමින් වහන්සේ ඔහු නැගිටුවනවා ඇත.’

දෙවියන් වහන්සේගේ සේවකයන් කැඳවනු ලබන්නේ රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීමට පමණයි. ඔවුන්ව සුව කරන්නේ සමිඳාණන් වහන්සේ ය. යේසුස් වහන්සේ හා යේසුස් වහන්සේ දෙස පමණක් බැලීමට, උන් වහන්සේට මොරගැසීමට, උන් වහන්සේව සෙවීමට අප ජනතාවට යොමු කළ යුතුය. ඔවුන්ගේ පාපය ගැන පසුතැවිලි වී උන් වහන්සේව අනුගමනය කිරීම. සමිඳාණන් වහන්සේ රොගින්ව සුව කරන අතර උන්වහන්සේ ඔවුන්ව මරණ යහනෙන් නැඟිටුවනු ඇත.

සිදු වන සුව කිරීම් වලින් දෙවියන් වහන්සේගේ සේවකයන් මහා විශාල වශයෙන් දෙයක් ලෙස එය සැල කිය යුතු නැත. යේසුස් වහන්සේ බොහෝ විට තමා සුව කළ අයට පැවසුවේ එය ප්‍රසිද්ධියට පත් නොකරන ලෙසයි. අපත් එම ආදශර්ය අනුගමනය කළ යුතුය. සුව කිරීම් ප්‍රසිද්ධ කිරීමට අපට අවශ්‍ය නැත.

සමහර අය සුව නොවන්නේ ඇයි? එය ඇදහිල්ලේ මදිකම නිසාද ?

මම විශ්වාස කරන එක් දෙයක් නම්, දෙවියන් වහන්සේගේ සේවකයෙකු ලෙස, අපි උන් වහන්සේට යටත් වී අපගේ මාංසයට මැරෙන තරමට, දෙවියන් වහන්සේගේ මහිමය උදෙසා අපගේ දේවසේවය තුළින් උන්වහන්සේගේ බලය ගලා ඒමට පටන් ගනී. 2 කොරින්ති 4:10 'යේසුස් වහන්සේගේ ජීවිතය අපගේ ශරීරය තුළද එළිදරව් වන පිණිස අපි සැමවිටම අපගේ ශරීරය තුළ යේසුස් වහන්සේගේ මරණය ගෙන යන්නෙමු. 6. අප පාපයට මැරිය යුතුය. අපේ මාංසයට මැරිය යුතුයි මෙන්ම අපේ මමත්වයට

මැරිය යුතුයි. යේසුස් වහන්සේගේ ජීවිතය යන්නෙන් අදහස් කරන්නේ උන් වහන්සේගේ චරිතය හා බලයයි (ක්‍රියා 10:38).

කෙසේ වෙතත්, මෙම ප්‍රශ්නයට යම් දුරකට පිළිතුරු දීමට උපකාර වන යමක් යේසුස් වහන්සේගේ මෙලොව සේවයේද අපට පෙනේ.

ශුභාරංචි 4 කියවන විට (ශු.මතෙව්, මාක්, ලූක් සහ යොහන්) යේසුස් වහන්සේ බර් තලමෙව්ස්, ලාදුරු රෝගීන් 10 දෙනා, යායිරස්ගේ දියණිය සහ තවත් මුණගැසුණු බොහෝ රෝගීන්ව සුව කරන ලැබූ බව අපට පෙනේ. ශු. යොහන් 5: 1: 14 හී බෙතෙස්දා පොකුණ අසල බොහෝ රොගින් සිටියත් යේසුස් වහන්සේ සුව කළේ අවුරුදු 38 ක් වයසැති ආබාධිත වූ එක් මිනිසෙකු පමණි. ශු.මතෙව් 4: 23-24, 8:16, 9:35, 15: 30-31, ශු.මාක් 1:34, 3:10, ශු. ලූක් 4:40, ශු. ලූක් 7:21 කියවන විට යේසුස් වහන්සේ සියලු දෙනාවම සුව කල බවත්, යේසුස් වහන්සේ බොහෝදෙනෙකුව සුවකල බව හා යේසුස් වහන්සේ සෑම රෝගයක්ම සුව කල බව සඳහන්වේ.

මේමගින් මා ඔබට කියන්නට උත්සාහ කරන්නේ කුමක්ද? යේසුස් වහන්සේ සියල්ල සුව කළ අවස්ථාද ඇත. එහි ‘බොහෝ’ යැයි පවසන තැන, උන්වහන්සේ සමහරුන් සුව නොකළ යැයි සිතීම අවකාශ බොහෝ ඉඩ ඇත. ඇයි ඒ? උන්වහන්සේගේ බලය සීමිතද? උන්වහන්සේගේ බලය සීමිත නොවේ. උන්වහන්සේට කළ නොහැකි කිසිවක් නැත.

කෙසේ වෙතත්, දෙවියන් වහන්සේගේ චරිතයේ තවත් පැතිකඩක් අප මතක තබා ගත යුතුය. ශුද්ධ ලියවිල්ල රෝම 9: 18 හි සඳහන් වේ ‘එබැවින් දෙවියන් වහන්සේ දයාව දැක්වීමට කැමති අයට අනුකම්පා කරයි’. දෙවියන් වහන්සේට කළ නොහැකි කිසිවක් නැත. සෑම ආකාරයකම අසනීප සුව කිරීමට උන්වහන්සේට හැකිය. කෙසේ වෙතත්, සුව කිරීමේ තීරණය උන් වහන්සේ හා සතුව පමණක් පවතී. උන්වහන්සේ සෑම කෙනෙකුම සුව නොකරන්නේ ඇයි? දෙවියන් වහන්සේ අපට හෙළි කර නොමැති උන්වහන්සේ පමණක් පිළිතුරු දන්නා ප්‍රශ්න ඇත. අපට අණ කර ඇත්තේ ඇදහිල්ලෙන් රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීම සහ ඉතිරි දේ උන් වහන්සේට භාර දීම පමණි.

මෙයින් අදහස් කරන්නේ ඔබ අද ඔබව සුව කරන ලෙස උන් වහන්සේගෙන් ඉල්ලුවොත්, උන්වහන්සේ ඔබව සුව නොකරන බවට හැකියාවක් තිබේද යන්න ද ? ශු. මතෙව් 8: 2, ශු.මාක් 1:40 සහ ශු. ලූක් 5: 12 හි ලාදුරු රෝගියා යේසුස් වහන්සේ ගෙන් ඇසූ විට, “ඔබ කැමති නම්, ඔබට මාව සුව කළ හැකියි” කියූ විගස තමන් වහන්සේ කැමති යැයි පවසමින් සුව කල සේක. ඔබ යේසුස් වහන්සේව කෙලින්ම සොයන්නේ නම්, උන්වහන්සේ සැමවිටම ඔබව සුව කිරීමට කැමැත්තෙන් සිටී. ලිපියේ මා කලින් සඳහන් කළ කාරණය මෙයයි. යේසුස් වහන්සේ දෙස පමණක් බලන්න. උන් වහන්සේට මොරගසන්න. උන් වහන්සේව සොයන්න. ඔබේ පාපය ගැන පසුතැවිලි වී උන් වහන්සේව අනුගමනය කරන්න. ඔබ උන්වහන්සේගෙන් ඉල්ලන විට උන්වහන්සේ ඔබව සුව කිරීමට කැමැත්තෙන් සිටී. කිසිම මිනිසෙකු පසුපස දුවන්න එපා. ඔව්, ශුද්ධාත්මයාණන් සුවපත් කිරීමේ හා ප්‍රාතිහාර්යන් නමැති ත්‍යාගයෙන් මිනිසුන්ව අභිෂේක කරයි, නමුත් දවස අවසානයේදී බලය උන් වහන්සේට අයිති වන අතර උන්වහන්සේ සුව කරයි. එබැවින් අපට එවැනි දීමනා ලැබුණද, එම දීමනා භාවිතා කළ යුත්තේ යේසුස් වහන්සේගේ මහිමය සඳහා මිස ඔබේ පෞද්ගලික මහිමය හා කීර් තිය සඳහා නොවේ. යේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබා උන් වහන්සේව සෙවීමට අප මිනිසුන්ට යොමු කළ යුතුය. එවිට පමණක් ඔවුන්ට සුවය ලැබේ.

ඉතින්, කොරෝනා වෛරසය ඇති අයව සුව කිරීමට යේසුස් වහන්සේට පුළුවන්. ඔවුන් කළ යුතුව ඇත්තේ උන් වහන්සේට හඬනැගීම හා උන් වහන්සේ දෙස පමණක් බැලීමයි. උන්වහන්සේ ඔවුන්ව සුව කරයි. මෙම කාලය තුළ අපගේ යුතුකම වන්නේ සමච්චල් කරන්නන් නොසලකා හැරීම සහ මෙම අසනීපයෙන් පෙළෙන අයගේ සුවය සඳහා ඇදහිල්ලෙන් දිගටම යාච්ඤා කිරීමයි. දෙවියන් වහන්සේ ඉතිරි දේ කරනු ඇත.